www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වෙළඳපොලවල් ස්ථාවර වී ඇති නමුත් "භීතියේ දුර්ගන්ධය" වාතයට මුසුව තිබේ

## Markets stabilise but "smell of fear" is in the air

**නික් බීම්ස් විසිනි**

**2010 මැයි 24**

පසුගිය සති අන්තය වන විට ගෝලීය වෙළඳපොලවල් ස්ථාවර වූ නමුත්, යුරෝ කලාපයේ මූල්‍ය අර්බුදය විසින් උද්ගත කල කලබැගෑනිය තවමත් පටන්ගත්තා පමනක්ය යන ගැඹුරුවන කනස්සල්ලක් පැතිර පවතියි.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය, "භීතියේ දුර්ගන්ධය වාතයට මුසුව ඇතැයි" සිය ගනුදෙනු කරුවන්ට ලියා යැවූ එක් වෙළඳපොල විශ්ලේෂකයෙක් උපුටා දැක්වීය. 2008 සැප්තැම්බරයේදී එක්සත් ජනපදයේ ලේමන් බ්‍රදර්ස් ආයෝජන බැංකුව බිඳවැටුනු තැන් පටන් ඔහුට මෙවන් හැඟීමක් පහලව තිබුනේ නැත.

විකුනා දැමීමෙන් පසුව පැවති දර්ශනය කැටිකරමින් එෆ්ටී මෙසේ වාරතා කරයි. "දැන් ප්‍රශ්නය වන්නේ මිලදීගැනීමේ ප්‍රවනතාව එලඹෙයි ද නැතහොත්, වැඩියෙන්ම නැඹුරුව පවතින, යුරෝව පහතට ඇද දමමින් හා අවසානයේදී යුරෝ කලාපය බිඳී යාමට මග පාදමින් නය අර්බුදය තවදුරටත් පාලනයෙන් ඉවතට කැරකී යයි ද යන්නයි. අර්බුදය දැඩි නය බරින් මිරිකී සිටින අනෙකුත් රටවලට, එනම්, ජපානය, එක්සත් රාජධානිය හා එක්සත් ජනපදයට පවා පැතිරී යමින් මහා ප්‍රති උත්තෝලනයේ හා අවධමනයේ අවතාරය හිස ඔසවනු ඇතැයි බියපත් වූවන් ද සිටියි."

ලේමන් අර්බුදයෙන් පසුව ආන්ඩු හා මහ බැංකු විසින් මූල්‍ය පද්ධතිය තුලට දැවැන්ත පරිමානයෙන් මුදල් එන්නත් කිරීමේ තැන් පටන්, එය වෙළඳපොලවල් යලි පනගැන්වීමක් වුවත්, එහි සිදුවූ විශාලතම වැටීම පසුගිය සතියේ ගෝලීය විකුනා දැමීමෙන් සලකුනු කෙරිනි. මෙම වසරේ අප්‍රේල් මැද සිට ෆුට්සි සමස්ත මිල දර්ශකය සියයට 14 න් වැටුනි. "නැඟීඑන වෙළඳපොලවල්" ලොකුම පිරිහීම පෙන්නුම් කල අතර වෝල් වීදියේ ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් 500 දර්ශකය මෑතක පෙන්වූ එහි ඉහලම අගයෙන් සියයට දහයක් පහත වැටුනි.

වෙළඳපොල දහනශීලීත්වය මනින වීඅයිඑක්ස් දර්ශකය මාසයකට පෙර තිබූ 15 මට්ටමේ සිට 21 වන දින වනවිට 50 දක්වා 2009 මාර්තු මාසයෙන් පසුව එහි ඉහලම මට්ටමට ලගාවීම ද කැපී පෙනෙයි. පසුගිය සතියේදී එම දර්ශකය ඉහල නැගී වේගය 2008 සැප්තැම්බර්-ඔක්තෝබර් අර්බුදය තුල වාර්තාගතවූ වේගයටත් වඩා වැඩිය.

යුරෝ කලාපීය ඇපදීමේ පැකේජය වන යුරෝ බිලියන 750 න් බිලියන 148 ක් ජර්මන් චාන්සලර් ඇන්ජෙලා මර්කෙල් පොරොන්දුවූ අතර එය අනුමත කිරීමට බුන්ඩෙස්ටාග් හෙවත් ජර්මන් පාර්ලිමේන්තුව ගත් තීරනයත් සමග 21 දින වෙළඳපොලවල ඉල්පීමක් ඇති විය.

ඊට පක්ෂව ඡන්ද 319 ද විපක්ෂව 73 ද ලැබුනු අතර 195 දෙනෙක් ඡන්දය දීමෙන් වැලකී සිටියේය. ඒ ප්‍රධාන කොටම සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ එස්පීඩී සංවිධානයයි. එහෙත් ඇගේම සීඩීයූ හෙවත් ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පසුපෙලෙහි විරුද්ධත්වය අවම තරමින් තාවකාලිකව හෝ පාලනය කරගැනීමට මර්කෙල් අසමත් වූවානම් විරුද්ධත්වය වැඩිවීමට ඉඩ තිබුනි. ගෙවීම සඳහා බලය පැවරීමට විරුද්ධව සීඩීයූ සාමාජිකයන් 10 ක් ඡන්දය දුන්හ. එක් නිරීක්ෂකයෙකුට අනුව සීඩීයූ සාමාජිකයන් විසින් "ප්‍රායෝගිකව වහලය උසට හුරේ දැමීමක්" වූ බව දැක්වූ පියවරක් වන බැඳුම්කර වෙළඳපොලෙහි "අමු අමුවේ කෙරෙන හදිසි විකිනීම්" මත තහනමක් මර්කෙල් විසින් නිවේදනය නොකලානම් අනෙක් පසට යෑම් තවත් සිදුවිය හැකිව තිබුනි.

යුරෝ කලාපයේ මුදල් වෙළඳපොලවල විශ්වාසය යලි ගොඩනැඟීමේ පියවරක් ලෙස යුරෝ සංගමයේ මුදල් ඇමතිවරු, යුරෝ සංගමයේ අයවැය නීති උල්ලංඝනය කරන සාමාජික රටවලට එරෙහිව තහංචි පැනවීමේ සැලසුම් සාකච්ඡා කිරීමට පසුගිය 21 දින බ්‍රසල්ස් හිදී රැස්වූහ. කථාබස් වලින් පසුව පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී යුරෝ සංගමයේ සභාපති හර්මන් වැන් රොම්පුයි පැවසුවේ, "මූල්‍ය තහංචි

හා මූල්‍ය නොවන තහංචි පිලිබඳ කාරනය මත පුලුල් එකඟතාවක්" පැවති බවයි. යුරෝ සංගම් මුදල් ඇමතිවරු හා ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරි මාසය තුල දෙවරක් මුන ගැසී මේ වසරේ පසු භාගයේදී පැවැත්වීමට නියමිත යුරෝ සංගමයේ රාජ්‍ය නායක සමුලුවට ප්‍රගති වාර්තාවක් සපයනු ඇත.

එහෙත් 21 දින සාකච්ඡාවලින් පසුව පෙන්නුම් කල එකමුතුව පසෙකින් දැනටමත් මතභේද මතුවෙමින් තිබේ. ප්‍රන්සයේ බලපෑම යටතේ ඇමතිවරු යුරෝ සංගමයේ ගිවිසුම්වල වෙනස්කම් ඇතිකිරීමට ගතයුතු පියවර සාකච්ඡා නොකර මඟහැරිය අතර, අනෙක් අතින් ජර්මනියට, දැඩි පියවර අවශ්‍ය විය. ඒවාට, සෑම ආන්ඩුවකම ස්ථායිකරන වැඩ සටහන ස්වාධීන මන්ඩලයක් විසින් සහතික කිරීමත්, සාමාජික රටවල් තම ජාතික නීති පද්ධතියට යුරෝ සංගමයේ ස්ථායිකරන හා ප්‍රවර්ධන ගිවිසුම් ඇතුලත් කරන බවට සහතිකවීමත් අඩංගු විය.

අයවැය හිග ඉලක්ක සම්පූර්න කිරීමට අසමත් වන යුරෝ සංගමයේ රටවලට තහංචි දැමීමට ද ජර්මනිය බලපෑම් කලේය. ඒ අතර, යුරෝ සංගමයේ නිශ්චිත අරමුදල් වෙත පිවිසීමේ ඉඩ ඇවිරීම හා ඡන්ද අයිතිය අහෝසි කිරීමත් ඇතුලත් විය. ජාතික අයවැය ලේඛන අනුමත කිරීමට පෙර, යුරෝ සංගමයේ ප්‍රමිතියට අනුව විමර්ෂනය කල යුතු බවට ද එය යෝජනා කලේය.

"ජාතික පාර්ලිමේන්තු ස්වෛයිරී වන අතර අයවැය සැලසුම් පිලිබඳව ඒවා පලමුව දැනුවත් කල යුතු" යයි අවධාරනය කල අලුතෙන් පත්වූ බ්‍රිතාන්‍ය මුදල් ඇමති ජෝර්ජ් ඔස්බෝන් වෙතින් මෙයට වහාම විරෝධය එල්ල විය. ඒ සමගම, බර්ලිනයේ සංචාරයක නිරත බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරෝන් "තව තවත් බලතල වෙස්ට්මිස්ටර් වෙතින් බ්‍රසල්ස් වෙත මාරු කිරීමේ" නව නීති වලට තමන් විරුද්ධ බව තෙවරක්ම කියා සිටියේය. මෙහි අර්ථය ලෙස පෙන්වාදී තිබුනේ, එක්සත් රාජධානිය මත කෙලින්ම බලපාන පියවරයන්ට ඔහු විරුද්ධවනු ඇති අතර බ්‍රිතාන්‍ය කොටසක් නොවන යුරෝ කලාපයේ සාමාජිකයන්ට පමනක් බලපාන පියවරයන්ට ඔහු සහාය දෙනු ඇති බවයි.

සියලු යුරෝපීය ආන්ඩු මූල්‍ය වෙලඳපොලෙහි අන පරිදි ක්‍රියාකරමින් අර්බුදය, කම්කරු පන්තියේ සමාජ තත්වයන්ට පහරදීම සඳහා යොදාගැනීමේ තල්ලුව පිලිබිඹු කරමින් මාධ්‍ය අවධානය යොමුව තිබුනේ, අයවැය හිඟයන් හා මූල්‍ය රෙගුලාසිවල හිඟකම පිලිබඳ කාරනය කෙරෙහිය. කෙසේ වෙතත් අනෙකුත් විශ්ලේෂන පෙන්නුම් කලේ අර්බුදය පිටුපස ඇති හේතුව යුරෝපීය බැංකුවල නරක අතට හැරෙන තත්වයයි.

මේ විශ්ලේෂනයට අනුව, සමහර බැංකුවලට හානි සිදුවීමට තුඩුදිය හැකිව තිබූ පියවරක් වන ග්‍රීක නය "ප්‍රතිව්‍යුහගත කිරීමක්" කෙරෙහි මනාපය පලකල ඇපදීමේ පැකේජය, යුරෝපීය බැංකු පද්ධතිය දුර්වල කිරීමට හේතුවිය.

ඩර් ස්පීගල් සඟරාව සමඟ පසුගිය සතියේ පැවති සාකච්ඡාවකදී ජර්මන් මහ බැංකුවේ හිටපු ප්‍රධානී කාල් ඔටෝ පෝල්, යුරෝවේ පදනම් වෙනස්කිරීම හා යුරෝ කලාපය "මාරුකිරීමේ සංගමයක්" බවට හැරවීම පිලිබඳව ඇපදීමේ සැලැස්ම හෙලා දැකීය.

ඇපදීමේ පැකේජය, "නය කටුගා දැමීමේදී ජර්මන් මෙන්ම ප්‍රන්ස බැංකු වලට ද ආරක්ෂාව සැලසීම පිලිබඳව උනන්දු විය. ගලවා ගැනීමේ පැකේජයට එකඟත්වය පලවූ දිනයේම ප්‍රන්ස බැංකුවල කොටස් සියයට 24 කන් ඉහල ගියේය. ඒ අනුව බලන විට මෙය සැබවින්ම, ග්‍රීක ධන කුවේරයන් හා බැංකු ගලවා ගැනීම පිලිබඳ විශේෂිත කාරනාවක් වූ බව ඔබට පෙනී යනු ඇත."

බ්‍රසල්ස්හි බුද්ධි මන්ඩලයක් වන බ්රූගල් හි ජ්‍යෙෂ්ඨ විශ්ලේෂකයෙක් වන නිකොලස් වර්රොන් පසුගිය සතියේ සූදානම් කල සටහනකින්, "යුරෝපීය බැංකු අඩමාන වීමේ හරය, මැයි ආරම්භයේ පටන් සිදුවෙමින් තිබෙන නාටකාකාර ප්‍රතිපත්ති වෙනස්කම්" තුල පවතින බව පෙන්වා දුන්නේය.

"අවම වශයෙන් පශ්චාත් ලේමන් කම්පනයේ පටන්, යුරෝපීය බැංකු ක්‍රමය බෙහෙවින් අස්ථායි තත්වයකට පත්ව තිබේ. ලබාදීමට නියමිත පොදු ද්‍රවශීල ආධාර මගින්, ග්‍රීසියේ මෙන් ඉහල ප්‍රතිලාභ සහිත නයවල අමතරව ආයෝජනය කිරීමට දුබල බැංකු දිරිගන්වන හිතුවක්කාරී අතිරේක බලපෑමක් සිදුකර තිබේ."

"සමහර යුරෝපීය බැංකු සතුව ප්‍රබල ශේෂ පත්‍ර තිබෙන නමුත්, පද්ධතිය එහි දුබලම පුරුක් තරමටම ශක්තිමත්ය. ඒවා පවතින්නේ කොතැනක ද යන්න පවා අපි හරිහැටි නොදන්නෙමු."

"ප්‍රන්සයේ හා ජර්මනියේ අය ද ඇතුලුව දේශපාලන නායකයින්, ජාතික බැංකු සංස්ථාපිතයන් විසින් තදින්ම මිරිකාගෙන සිටීමේ" කාරනය පිලිබිඹු කරමින්, යුරෝ සංගමය යුරෝපීය බැංකු පිලිබඳව විමසුමක් කර නැතුවාක් මෙන්ම ඒවා "වෙහෙස උරගා බලන" පරීක්ෂනවලට පවා යොමුකර නැති බව වර්රොන් සඳහන් කරයි. බැංකු ක්ෂේත්‍රයේ සමහර " කප්පිත්තන්" වැටී සිටින "කනගාටුදායක තත්වය" ගැන හෙලිකිරීමට ජාතික නිලධරයන් බියවෙති. මක්නිසාද යත් එමගින් ඒවා අත්පත්කර ගැනීමේ ඉලක්ක බවට පත්විය හැකි බැවින්ය. යුරෝ සංගමයේ බැංකු

ප්‍රතිව්‍යුහකරනය අසාර්ථක් වුවහොත් "විනාශකාරී ප්‍රතිවිපාක" අත්විඳීමට සිදුවනු ඇති බවට ඔහු අනතුරු අඟවයි.

යුරෝ කලාපයේ ඇපදීමේ පැකේජය පිලිබඳ වඩා ප්‍රසිද්ධියට පත්කොට නැති උපාංගයක් වන්නේ, පූර්වයෙන් දැඩි ලෙස ක්‍රියාත්මක කල ප්‍රතිපත්තියක් වන, ආන්ඩුවල බැඳුම්කර මිලට ගැනීමට යුරෝපීය මහ බැංකුවට සලසාදී තිබුනු ඉඩකඩ අවුරාලීමේ තීන්දුවයි. යුරෝ කලාපයේ වඩාත්ම පීඩාවට පත්ව තිබූ පෘතුගාලය, අයර්ලන්තය හා ග්‍රීසියේ වෙලඳපොලවල් මුලුමනින්ම කැටි ගසීමෙන් පසුව මහ බැංකුව, බැඳුම්කර මිලට ගැනීම සඳහා යුරෝ බිලියන 16.5 යොදවා තිබුනු බව වාර්තා විය. ඉකොනොමිස්ට් සඟරාව වාර්තාකොට තිබුනේ, ග්‍රීක හා පෘතුගාල නයට අදාල ද්විතීයික වෙලඳපොලවල් පිලිබඳ කාරනයේදී " එකම සැබෑ ගැනුම්කරුවා ලෙස පෙනී ගියේ යුරෝපීය මහ බැංකුව පමනක්" බවයි.

මේ සතියේ මූල්‍ය වෙලඳපලවල හැසිරීම කුමක් වුවත්, ඇපදීමේ පැකේජය වැඩිම වුනොත් මූල්‍ය අර්බුදයට කෙටිකාලීන පැලැස්තරයක් පමනක් වනු ඇති අතර දිගු කාලයේදී තත්වය වඩාත් නරක අතට හැරෙනු ඇති බව පැහැදිලිය.

© www.wsws.org